# 34

# උපාධිධාරී බුද්ධිමතුන්ගේ වගකීම සහ සමාජ මෙහෙවර

## මහාචාර්ය දයාසිරි ප්‍රනාන්දු

ගරු කුලපති ස්වාමීන්වහන්ස, උපාධි ප්‍රදානෝත්සවය ඇමතීමට ඔබ වහන්සේගෙන් ලද ආරාධනය ම විශාල භාග්‍යයක් ලෙස සලකනවා. මෙවන් දුලබ අවස්ථාවක් මට ලබාදීම ගැන ඔබ වහන්සේට බොහෝ සෙයින් ස්තුතියි. ගරු කුලපති ස්වාමීන්වහන්ස, අපට හුරු පුරුදු දසුනක් වන සැහැල්ලු උපාධි අපේක්ෂකයන් වෙනුවට, උපාධි ලෝගුවෙන් සැරසී සිනාමුසු මුහුණින් අද මෙතැන සිටින මේ තරුණ තරුණියන් දැකීමත් මට මහත් සතුටක්.

ආදරණීය උපාධිධරයනි, අද දිනය ඔබේ ජීවිතයේ ඉතාම වැදගත් දිනයක් අතිගරු කුලපති ස්වාමීන්වහන්සේ අතින් ඔබ උපාධිය ලබන්නේ අද දිනයි. වසර ගණනාවකට ඉහත දී මමත් ශිෂ්‍යාධාර පහසුකම්ලාභී උපාධි අපේක්ෂකයෙක්. අද වැනි දිනයක මමත් මාගේ උපාධි ලෝගුව හැඳ ඔබ වාගේ ම ශාලාවේ සිටියා. ඒ නිසා ඔබේ හදවතේ ඇති හැඟීම් කොයි වගේ ද කියා මා දන්නවා. ඔව්, අද දිනය ඔබට ඉතාම වැදගත් දිනයක්. ඒ වගේ ම ප්‍රේක්ෂකාගාරයේ සිට ආඩම්බරයෙන් ඔබ දෙස බලා සිටින ඔබේ දෙමාපියන්ටත්, පවුලේ අයටත් අද වැදගත් දිනයක්. ඔබට මඟ පෙන්වූ ගුරුවරුන්ටත් අද බොහොම වැදගත් දිනයක්. ඇත්ත වශයෙන්ම, මෙම උත්සවයට සහභාගී වී, ඒ සතුට බෙදා හදා ගන්නට ලැබීම ගැන මා බෙහෙවින් සතුටට පත් වෙනවා.

ගරු කුලපති ස්වාමීන්වහන්ස, මේ කථාව පවත්වන්නට මට ආරාධනාව ලැබුණු මොහොතේ, හෙන්රි ජයසේනයන්ගේ වේදිකා නාට්‍යයක පේළි කිහිපයක් මට සිහිපත් වුණා. වසර ගණනාවකට ඉහත දී එම නාට්‍යයේ බලධාරී චරිතය රඟපෑමට මම ද වාසනාවන්ත වුණා. එහි කියවෙනවා, ''කාගෙද මේ සිසු දරුවා? අපගෙයි මේ සිසු දරුවා. කවුද එහෙම කියන්නේ? හැමදෙනාම කියන්නේ?'' ඔව්, ඇත්ත වශයෙන්ම, උපාධිධාරී නෝනාවරුනි, මහත්වරුනි, ඔබ අපේ සිසු දරුවන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිසු දරුවන්. ඔබ ආ ගමන් මඟ දෙස හැරී බලන්න. එවිට ඔබට පෙනේවි ඔබ දිගු ගමනක් ඇවිත් තිබෙන බව. ඔබ ආ ඒ මඟ ආරම්භයේ දී, ඔබ දෙස ඉතාමත් උනන්දුවෙන් බලා සිටි අය ඔබට පෙනේවි. ඒ ඔබට නිතරම ආශිර්වාද කළ ඔබේ දෙමාපියන් සහ පවුලේ උදවියයි ගමන ආරම්භයේ ඉන්නේ.

අනතුරුව, දැනුම සහ ප්‍රඥාව සොයා ඔබ ආ මේ ගමනේ, ඔබේ ගුරුවරුන් සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් ද ඔබ ළඟින් සිටියා. ඔබේ ගමන් මඟ අතරමඟ නතර කරන්නට වෙහෙසුණ අයත් සිටින්නට ඇති. අප එවැනි දේත් බලාපොරොත්තු විය යුතු යි. ඒවා අමතක කරන්න. ''ඩිස්පියුටඩ් පැසේජ්'' යන පොතෙහි ලොයිඩ් ඩග්ලස් ගේ වදන් සිහිපත් කරන්න. ''ඔබ පාඩම් ඉගෙන ගන්නේ ඔබව වර්ණනා කරන අයගෙන් විතරම ද? ඔබට මඟ අවුරා සිටි අයගෙන් ඔබ ඊටත් වඩා පාඩම් ඉගෙන ගත්තේ නැත් ද?'' අද, ඔබේ ගමනේ ඉලක්කය වෙත පැමිණ ඇති මේ මොහොතේ, ඔබ දෙස බලා සිටින, තවත් මිනිසුන් කණ්ඩායමක් සිටිනවා නොවේ ද? ඒ තමයි අපේ රටවැසියන්. ඔබේ අධ්‍යාපන වියදම් දරා සිටි මහජනතාව. ඔබේ දෙමාපියන්, ඔබේ ගුරුවරුන් වගේම මේ රටේ ජනතාව යන සියලු දෙනාම ඔබෙන් කිසිවක් අපේක්ෂා කරනවා. උපාධි අපේක්ෂකයකුව සිටි

ලෝකය සහ සුදුසුකම් ලද උපාධිධාරියකු ලෙස අද ඔබ පා තබා ඇති ලෝකය අබියස ඔබ සිටින මේ මොහොතේ ඔවුන් සියලු දෙනාම ඔබ දෙස බලා සිටිනවා.

උපාධිධාරී නෝනාවරුනි, මහත්වරුනි, දැන් ඔබ මේ අළුත් ලෝකයට පා තබන්නේ දැනුම හා ප්‍රඥාව ලද උගතුන් හැටියට බව මතක තබා ගැනීම වැදගත් කාරණයක්. ඔබට අවස්ථාව තිබුණා ඔබ සමඟ ඉගෙනගත් අය හා මෙන්ම, උගතුන් හා එක්ව කටයුතු කරන්නට, හොඳ පත පොතෙහි මෙන් ම පුස්තකාලවල ඇසුර ලබන්නට ඔබට අවස්ථාව ලැබුණා. ඒ නිසාම මේ අළුත් ලෝකයට පළමු පියවර තබන මේ මොහොතේ ඔබ ගැන පැහැදිලි වැටහීමක් ඔබ තුළ තිබිය යුතුය. ඔබ වෙනුවෙන් ම, රට වෙනුවෙන් ද පැහැදිලි දැක්මක් ඔබ සතු විය යුතුයි. ඒ සමඟ ම ඔබට ඇති සමාජ වගකීමත් බොහෝ විශාල යි.

ඔබ අතරින් සමහරෙක් ඉතා දක්ෂයන් වන විට, තවත් සමහරෙක් එතරම් දක්ෂ නොවන්නටත් ඇති. නමුත්, වෙන් වෙන් ව නොව, එකමුතු වීමෙන් සමාජයට දායකත්වයක් ලබා දීමට ඔබ සැමට හැකි බව මතක තබා ගන්න. ''පිල්ග්‍රිම්ස් ප්‍රෝග්‍රස්'' යන පොතෙහි ජෝන් බනියන් ගේ' වදන් සිහියට ගන්න; ''අඳුරු වළාවන් දිය බිඳු ගෙනෙද්දී පැහැබර වළාවන් කිසිවක් ම නොගෙනේ. ඔව්, ඒ වලාකුළු අඳුරු වුවත්, පැහැබර වුවත් රිදී දිය බිඳු පහළට ගලා හැලෙන්නට උපකාරී වේ. මහ පොළොව අස්වැන්න ගෙන දෙන්නේ ඒ වළාකුළු දෙවර්ගයට ම ප්‍රශංසා කරමිනි.''

නුදුරු කාලයේ දී ම ඔබ රැකියාවක නිතර වී ආදායම් උපයන්නට පටන් ගනීවි. එලෙනර් රූස්වෙල්ට් ගේ වචනයෙන් කියවෙන ආකාරයට; ''ලැබෙන දෙය ඔබ සතුටින් භාර ගත යුතුයි. එහි දී වඩා වැදගත් වන්නේ ඔබට හැකි උපරිමයෙන් කටයුතු කිරීම යි.''

උපාධිධාරී නෝනාවරුනි, මහත්වරුනි, සේවාදායකයා සහ සේවකයා යනුවෙන් රැකියාවක් කොටස් දෙකකින් යුතුයි. දෙපාර්ශවයට ම එකිනෙකා කෙරෙහි වගේම, සමාජමය වශයෙන් ද වගකීමක් තිබෙනවා.

සමාජමය වගකීමක් කියන්නේ ආචාරධර්ම හෝ මතවාදී සංකල්පයක්. රාජ්‍ය හෝ වේවා, සංස්ථාවක් හෝ වේවා, ආයතනයක් හෝ තනි පුද්ගලයෙක් හෝ වේවා, සැමදෙනාටම සමාජමය වගකීමක් තිබෙනවා. හැමදෙනාම කථා කරන්නේ ''සංස්ථාමය සමාජ වගකීම්'' ගැනයි. එය තමා හැම දෙනාගෙම මුව රැව්දෙන අළුත් ම කතාව. කිසිම රැකියාවක දී සේවාදායකයාට දිය හැක්කේ මොනවාදැයි සිතීම සුදුසු නැහැ. රැකියාවට ඔබගෙන් දිය හැක්කේ මොනවාද කියන එකත් ඒ හා සමානව ම වැදගත් වෙනවා. වෙනත් වචනයකින් කියනවා නම් අප හැමදෙනාම ''පුද්ගලික සමාජ වගකීමක්'' තිබෙනවා.

උතුම් වෘත්තියයන් හැටියට සලකන රැකියා දෙකක් දෙස බලන්න. වෛද්‍ය හා ගුරු වෘත්තීන්, ඒ වෘත්තීන් තිබෙන්නේ මුදල් හා ධනය රැස් කරන්නට නොවෙයි. ඒ වෘත්තීන් තිබෙන්නේ අන් අය සුවපත් කරන්නටත්, දැනුම ලබා දෙන්නටත් වගේම, ඒ වෘත්තියේ නියැලෙන්නන්ට විශාල මානසික තෘප්තියක් ලබා දෙන්නත් ය. වෛද්‍යවරයෙක් හෝ ගුරුවරයෙක් හෝ වීම දිව්‍යමය අවස්ථාවක්. අපේ මුතුන්මිත්තන්ගේ කාලයේ එම වෘත්තියේ නියැළුණු සේවාදායකයන් සිටියේ නැහැ. නමුත් ඒ වෘත්තීන් දෙකේ ම සේවාදායකයන් සිටිනවා. ඒ තමයි සෞඛ්‍ය හා අධ්‍යාපන අමාත්‍යාංශයන්. අප අද දකින, නිමක් නැති ගැටුම්වලට හේතු වී ඇත්තේ අවශ්‍යතාවන්ට අනුව, සම්ප්‍රදාය එසේ වෙනස් වීම යි. මහජනතාව වෛද්‍යවරුන් හා ගුරුවරුන් හඳුනන්නේ උගතුන් හැටියට යි. ඒ නිසාම ඉල්ලීම්

ද සාධාරණ විය යුතුයි. ඒවා හොඳින් සලකා බැලිය යුතුයි. ප්‍රශ්න හා ගැටළු විසඳීමේ දී අත්‍යවශ්‍ය වන්නේ සාකච්ඡාවන් හා කතිකාවන් මිස, ඉතා සුළු හේතූන් සඳහා ඉදිරිපත් වන වෘත්තීය සමිති ක්‍රියා මාර්ගයන් නොවෙයි. සියලු දෙනාට ම, සාධාරණ ලෙස ලබාදීම සහ ලබාගැනීම දෙපාර්ශවය තුළ ම ඇත්තේ නැහැ. අපි බොහෝ විට දකින්නේ ''රොබින් හුඩ් හා ෆ්‍රයර්'' වැනි තත්ත්වයන්. යටත් වන්නට දෙපැත්තම අකමැතියි. මේ නිසා දෙපැත්තකින් ම පෙළෙන්නේ කවුදැයි යන්නට ඔවුන්ට සිහිපත් වන්නේ නැහැ. ඒ අසරණ රෝගීන් හා අහිංසක පාසල් දරුවන්. බොහෝ විට ඔවුන් ගිරයට අසු වුණ පුවක් ගෙඩිය වගෙයි. උගතුන්ට එය නොපෙනෙන්නේ කොහොම ද, ඔවුන් එය දන්නවා නම්, අසරණ රෝගීන් වාට්ටුවල තනිකර, නොසලකා හැර, වෘත්තීය සංගමයකින් ගත් ක්‍රියා මාර්ග යන් පසු පස සෞඛ්‍ය සේවකයන් යන්නේ කොහොමද? එසේත් නැතිනම්, තමන්ගේ ලෙඩ දුකට බෙහෙත් ගන්නට බාහිර රෝගී අංශයට පැමිණ සිටින සිය ගණනක් රෝගීන් ප්‍රතික්ෂේප කරන්නේ කොහොමද? හදිසි රෝගීන්ට වෙදකම් කරන බව නම් ඔවුන් කියනවා. නමුත් හදිසි රෝගීන් යැයි කියා ඔවුන් හඳුන්වන්නේ කවුරුන් ද? හදිසි අවස්ථාවන් කියන්නේ මොනවාද? අපේ වීර සෙබලුන් බොහොමයකට වෙද හෙදකම් කරන වව්නියාවේ රෝහල සම්බන්ධයෙන් මෑතක දී වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයන් ගැන අසන්නට ලැබීම කණගාටුව උපදවන පුවතක්. යුද පෙරමුණේ සටන් වදින සෙබළකුට සිදුවන ඕනෑම සුළු ආබාධයක් වුණත්, හදිසි අවස්ථාවක්ම තමයි. කවුද සෙබළා කියන්නේ? තමාගේ යෞවන කාලයේ සුන්දර දේවල් පසෙක ලා, රට රකින්නට ඉදිරියට ගිය ඔබ වාගේ තරුණයන්. ඒ වාගේම සාමාන්‍ය පුද්ගලයෙකුට දැනෙන සුළු පපුවේ අමාරුවක් පවා ඔවුන්ට ඉතා බරපතල රෝගී තත්ත්වයක්. කවුද මෙය තීරණය කළ යුත්තේ? උතුම් වෘත්තීන්හි නියැලෙන උගතුන් මීට වඩා වෙනස් ආකාරයකට හිතන්ටත් ක්‍රියා කරන්නටත් පුරුදු පුහුණු විය යුතුයි.

ගුරු වෘත්තීය ගෙන බැලුවත් එය එසේ ම විය යුතුයි. ''දරුවනේ, අද මම ඔයාලට උගන්වන්නේ නැහැ'' එහෙමත් නැති නම්, ''වෘත්තීය සමිති උපදෙස් අනුව, ''මම හෙට දින අසනීප වෙනවා'' ''මම හෙට අසනීප නිවාඩු වාර්තා කරනවා'' කියා ගුරුවරයකු කොහොමද ඔහුගේ සිසු දරු දැරියන්ට කියන්නේ? එහෙම කරද්දී ඔවුන් උගන්වන්නේ මොනවා ද? වංකකම නොවේ ද? ''මම උත්තර පත්තර බලන්නේ නැහැ'' කියා කොහොමද ඔවුන් කියන්නේ? කොහොමද දරුවන්ට බෙහෙවින් වැදගත් වන විභාගවල ප්‍රතිඵල වුවමනාවෙන් ම පමා කරන්නේ? එසේ එම දරුවන්ට මෙසේ සලකන්නට තරම් ඒ අහිංසක දරුවන් කළ වරද මොකක් ද? වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවලට සහයෝගය දක්වන්නට ගුරුවරුන් වගේම අධ්‍යයන කාර්ය මණ්ඩල විසින් අහිංසක දරුවන් ඒවාට ඇදගෙන ගිය අවස්ථා ගැන අපට අසන්නට ලැබී තිබෙනවා. මේවා හරි දේවල් ද? අප මොනවාද අපේ දරුවන්ගේ සිත්වලට කා වද්දන්නේ?

වෛද්‍යවරයෙක් හැටියට අවුරුදු 40 ක් රාජ්‍ය අංශයේ සේවය කළ මා, වෘත්තීය සමිති ක්‍රියා මාර්ග යන් නිසා, එක් දවසක් හෝ මගේ සේවය නතර කර නැහැ. කොළඹ FMTA හි සභාපති හැටියට මමත්, වෘත්තීය සමිති නායකයෙක් හැටියට කටයුතු කර තිබෙනවා. ඒ කාලයේ දී විශ්වවිද්‍යා කාර්ය මණ්ඩලය විසින් වෘත්තීය සමිති ක්‍රියා මාර්ග ගත් අවස්ථාවක් තිබුණා. නමුත්, සිසුන් ගේ විභාග නිසා, මා අපේ සමිතියට, එයට එක් වන්නට ඉඩ දුන්නේ නැහැ. මොකක් ද ඊට හේතුව? මගේ ''පුද්ගලික සමාජ වගකීම්'' මොනවා ද කියා මා දැන සිටියා. අසරණ ජනතාවට බලපාන මෙවැනි ක්‍රියාවලදී ''නැහැ - බැහැ'' කියන්නට අපට ශක්තියක් තිබිය යුතුයි.

මෙහි තවත් පැත්තක් තිබෙනවා. බලන්න පෞද්ගලික වෛද්‍ය සේවය හා පුද්ගලික අමතර පන්ති දෙස. ඔවුන් ඒවා පවත්වාගෙන යන ආකාරය හරි ද? අපට බොහෝ විට අහන්නට ලැබෙනවා මෙයින් පීඩාවට පත්වන අයගේ විරෝධය සහ නොසතුට. මෙම වෘත්තීන්වල නියැලෙන සමහරු

කොයිතරම් පහත් තත්ත්වයට වැටී ඇත්දැයි අප දන්නවා. ඒ විදිහට ක්‍රියා කරන්න ඒ අයගේ ඒකායන බලාපොරොත්තුව මුදල් රැස්කිරීම පමණයි. කෝ ඔවුන්ගේ ''පුද්ගලික සමාජ වගකීම?''

මම කැමතියි අපේ වෛද්‍ය උපාධිධාරීන්ගෙන් සුවිශේෂී ඉල්ලීමක් කරන්න. වෘත්තිමයකුගේ ඇඳුමෙන් සැරසුණු ව්‍යාපාරිකයෙකු ලෙස නොවී, සැබෑ වෘත්තිමයකු ලෙස ඔබගේ ජීවිතය ගෙන යාමට ඔබ අදම අධිෂ්ඨාන කරගන්න.

උපාධිධාරී නෝනාවරුනි, මහත්වරුනි, සමස්ත රාජ්‍ය සේවයට ද මෙය පොදුවේ බලපාන කාරණයක්. නිලධාරිවාදයට මෙන් ම, විවිධ අමාත්‍යාංශවලටත් එය එසේ මයි. මහජනතාවට සේවය කරන විවිධ පුද්ගලයන්ගෙන් යුත් මණ්ඩල සහ සංස්ථාවලට ද එය එසේ මයි. කෝ ඔවුන්ගේ ''පුද්ගලික සමාජ වගකීම්?'' දිවංගත ජනාධිපති ප්‍රේමදාස මැතිතුමා කීවාත් මෙන් ''සෑම ලිපි-ගොනුවක් තුළ ම ඇත්තේ මනුෂ්‍යයෙකි'' අසරණ ජනතාව හිරිහැරයට පත් කිරීමත්, ඔවුන් ප්‍රාණ ඇපකරුවන් බවට පත්කර, තමන්ගේ ඉල්ලීම් ලබා ගැනීමත්, සමාව නොදිය හැකි අපරාධ හැටියට යි මා දකින්නේ.

ඊට අමතරව, තම තමන්ගේ හැකියාවන්ට අනුව නාස්තිය හා දූෂණය අවම කිරීමත් ඔබගේ ''පුද්ගලික සමාජ වගකීමක්''. එය ඔබට ලෙහෙසියෙන් කළ හැකි ය. පුංචි උදාහරණයක් ගනිමු. කන්තෝරුවල වැඩ කරන කී දෙනෙක් නම් තමන්ගේ කන්තෝරුවට අයිති ලියන කඩදාසි, පෑන් පැන්සල් ගෙදර ගෙනයනවා ද? එසේම, සෞඛ්‍ය අංශයේ කීදෙනෙක් නම් රෝගීන්ට දෙන්නට තිබෙන රෝහලේ බේත් හේත් ගෙදර ගෙනයන වරදට යොමු වී තිබෙනවා ද? මේ උදාහරණ නාස්තිය හා දූෂණය යන මහ සාගරයෙන් ගත් පුංචි දිය බිඳක් විතරයි. ඔබේ අළුත් ජීවිතය පටන් ගැනීමේ දී ම, එසේ ගෙදර ගෙනියන නරක පුරුද්දට ''තිත'' තබනු ඇතැයි මම විශ්වාස කරනවා.

උපාධිධාරී නෝනාවරුනි, මහත්වරුනි, ඔබේ වගකීම ඇත්තේ රැකියාවට පමණක් ම නොවෙයි. ඔබ උපාධිධරයකු වීම දක්වා ආ මෙම ගමන් මගේ ඔබ දිරිමත් කළ, ඔබට සහයෝගය දැක් වූ සෑම සියලු දෙනා වෙනුවෙන් ම ඔබට ''පුද්ගලික සමාජ වගකීමක්'' තිබෙනවා. අමතක කරන්න එපා, ඔබේ දෙමාපියන් සහ පවුලේ උදවිය ඔබේ ඒ ගමන්මග ආරම්භයේ දී ඔබ ළඟින් ම සිටි බව. ඔවුන්ට අපේක්ෂාවන් තිබෙනවා. ඔබටත් ඒ සම්බන්ධ වගකීමක් තිබෙනවා. ඔබට දැනුම හා ප්‍රඥාව ලබා ගැනීමට උදව් උපකාර කළ ගුරුවරුන් අමතක කරන්න එපා. ඔවුන්ගේ බලාපොරොත්තු සඵල වන ලෙස ජීවත් වන්නටත් ඔබ ගේ වගකීම් කොටස ඉටු කරන්නටත් හිතට ගන්න. ඔබේ ගුරුවරුන්ට නිතරම ගෞරව කරන්න. ඔවුන්ගේ සේවයට සෑමවිටම කෘතගුණ සලකන්න. ඒ වාගේම මේ රටේ ජනතාව ගැනත් සිහිපත් කරන්න. ඒ සැමදෙනාම ඔබ වෙනුවෙන් බලා සිටි අයයි. පාසලේ දී වගේම, විශ්වවිද්‍යාලයේ දීත්, ඔබ ආ මේ දිගු ගමනේ දී ඔබ හැමදෙනාටම පිහිට වුණේ ඔවුන්ගේ මුදල් බව අමතක කරන්න එපා. එය බොහොම වැදගත් කාරණයක්. ඔබ හැමදෙනා ගැනම ඔවුන් තුළ ඇති බලාපොරොත්තු අතිවිශාලයි. ඒ වගේම ඔවුන් සම්බන්ධයෙන් ඔබටත් ලොකු වගකීමක් තිබෙනවා. ඔවුන් බලාපොරොත්තු වන එක් දෙයක් තමය; ඔබ මේ රටට සේවය කරාවි, ඔබේ උගත්කමෙන් මේ රටේ ජනතාවට සෙත සැලසේවි කියන එක. ඔබ සේවය කළ යුත්තේ ශ්‍රී ලංකාවට මිස වෙන කිසිම රටකට නොවෙයි. මේ තමයි ඔබේ මව්බිම. ඒක තමයි සත්‍යය. මුදල් හා ධනයෙන් ඔබේ ඇස් ගිනි කණ වැටෙන්නට හරින්න එපා. පිටරටට යන්න. හැකි තරම් හොඳින් ඉගෙන ගෙන, ඒ උගත් දෙයින් මව් රටට සේවය කරන්න ආපසු එන්න. ඔබේ වෘත්තීය ජීවිතය සකස් කළේ මේ රටයි. දිවංගත අමාත්‍ය ලක්ෂමන් කදිරගාමර් මැතිතුමා වරක් ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ දී කියා සිටියේ මෙහෙමයි, ''ඔව්, ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය කියන්නේ කේක් එක මත තවරාපු අයිසිං තට්ටුවක් වගෙයි.

නමුත් ඒ කේක් එක පිළිස්සුවේ මගේ රටේ දී යි.'' කදිරගාමර් මැතිතුමාගේ පුද්ගලික වගකීම ඉෂ්ට කරන්නට ආපසු ලංකාවට ආවා. අවසාන හුස්ම පොද දක්වා ම මේ රටට සේවය කළා.

උපාධිධාරී නෝනාවරුනි, මහත්වරුනි, දවස අවසානයේ දී හැරී බලන කොට, සතුට රැඳී තිබෙන්නේ තමන් හරි හම්බ කළ මුදල් සම්භාරය මත නොවෙයි, තමන් ලැබූ ආත්ම තෘප්තිය මත යි. ''මම උපරිමයෙන් මට කළ හැකි සේවය ලබා දුන්නා. ඒ ගැන මා සතුටටත් සෑහීමටත් පත් වෙනවා'' යැයි කියන්නට ඔබවට හැකියාව තිබිය යුතුයි. උපාධිධාරී නෝනාවරුනි, මහත්වරුන එසේ කියන්නට හැකි තෘප්තියක්, අවංකවම, මා ලබා තිබෙනවා. ඒ වගේම ඔබලාත් ඉදිරි ජීවිතයේ දි, එසේ කියන්නට හැකි අන්දමින් තෘප්තිමත් වේ යැයි මා සිතනවා.

උපාධිධාරී නෝනාවරුනි, මහත්වරුනි, අපේ රටේ ඉගෙන ගත් අයගෙන් අනෙක් රටවල් එලනෙලා ගන්නවා දකීම බොහෝම දුක හිතෙන කාරණාවක්. මෙසේ සැප සම්පත් සොයා වෙන රටවලට ඇදී යන අය මහා මන්දිර සෑදුවත්, සැප වාහනවල ගමන් කළත්, ඔවුන් ඒ රටවල දෙවන පුරවැසියන් බව අමතක නොකළ යුතුයි. ගරු කුලපති ස්වාමීන්වහන්ස, නිල්ල සොයා එතෙරට ඉගිලෙන මේ කුරුල්ලන් වැඩිදෙනෙක්, තමන්ගේ විශ්‍රාමික ජීවිතය ගෙවන්නට ආපසු මව්බිම කරා ඇදී එන හැටි හරිම අපූරු දෙයක්. තමන්ගේ ණය ගෙවා ඉවරයි කියා හෝ යුතුකම් කොටස කළේ යැයි කියා හෝ කිසිවෙකුටත් කියන්නට බැහැ. එහි ඊට වඩා වැඩි යමක් තිබෙනවා. ඔබ මේ තත්ත්වයට එනතුරු, ඔබට පිහිටට හිටි අය බොහෝමයි. ඔබ මෙලොවට උපන් මොහොතේ පිහිටට ආ වෛද්‍යවරයා, වින්නඹු අම්මා, ඔබේ පවුලේ අය, ඔබව රැකබලා ගත් අය, ඔබට කෑම බීම පිළියෙල කළ අය, ඔබේ කිළිටි රෙදි සේදූ අය, පාසලට, විශ්වවිද්‍යාලයට ගමන් පහසුව සැලසූ අය - ඔව් ලැයිස්තුව නම් බොහොම දිගයි. ඒ හැම දෙනාට ම ඔබ ණය ගැතියි. ඉතින් මෙය රුපියල් ශත අතර ගැටළුවක් නොවෙයි. එය ඔබේ ''පුද්ගලික සමාජ වගකීම'' සම්බන්ධ ප්‍රශ්නයක්.

ඔබ මේ උපාධියත් රැගෙන මේ ශාලාවෙන් පිටතට ගොස් නව දිවියක් අරඹන මොහොතේ, ඔබ දෙස දෑස් අයාගෙන බලා සිටින අපේ රටට අයත් ඒ හැමදෙනාම වෙනුවෙන් ඉටු කළ යුතු වගකීම් රැසක් ඔබට තිබෙනවා. විලියම් තෝමස් ගේ වචනයෙන් කියනවා නම්, ''අපට, අපේ රට වෙනුවෙන් දිය හැකි ශ්‍රේෂ්ඨතම ත්‍යාගය, එසේත් නැති නම් අතිඋතුම් ම ත්‍යාගය නම් අපේ උපරිම සේවය යි. එයින් අදහස් වෙන්නේ අපේ දැනේ හැකියාව හා ඥානය පමණක් ම නොවෙයි. අපේ සිහින, අපේ සියුම් අභිප්‍රායයන් හා අපි අපට ම ගිවිස ගත් උදාර පොරොන්දුත් ඊට එක් විය යුතුයි.''

ගරු කුලපති ස්වාමීන්වහන්ස, මා නැවත වරක් ඔබ වහන්සේටත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයටත් බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මගේ මේ දේශනයෙන්, මේ අලුත් උපාධිධරයන්ගේ සිත් තුළ ''පුද්ගලික සමාජ වගකීම'' කියන බීජුවටය වපුරන්නට මට අවස්ථාව ලබා දීම ගැන මා සතුටු වෙනවා. ඒ වරප්‍රසාදය ලබා දීම ඉතාමත් අගය කොට සලකනවා.

ආදරණීය උපාධිධරයනි, ඔබ සැමට පිදෙන මගේ ශුභාසිංශන පිළිගන්න. ශ්‍රී ලංකාව තුළ ඔබ සියලු දෙනාටම සතුටින් පිරි ජීවිත උදා වේවා කියා ඉත සිතින් ම මම ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේ ම, ඔබෙන් අපේ රටට යහපතක් ම සැලසෙන බව මගේ අවංක විශ්වසායය. ඔබලාගේ සත්කාර්යයන් රටට ආලෝකයක් වේවා! ඔබ සැම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් බිහි වූ උපාධිධරයන් බව ලෝකයාට පසක් වන්නට එය ම හේතු වාසනා වේවා!

*2008.01.02*